නිපුණතාව : නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි.

නිපුණතා මට්ටම :නාට්‍ය යනු කුමක්දැයි නිර්වචනය කරයි.

ක්‍රියාකාරකම: නාට්‍ය හඳුනාගනිමු.

***නාට්‍යයක් යනු .....***

යම්කිසි ***සිදුවීමක්*** හෝ ***අවස්ථාවක්,නළු නිළියන්*** මගින් ***සමාරෝපය , අනුරූපණය*** භාවිතා කරමින් ***සතර අභිනය*** මූලික කොටගෙන ***ගැටුම ,කුතුහලය*** හා ***රසය*** ඇතිවන ආකාරයෙන් ***අවකාශයක්*** තුළ ***ප්‍රේක්ෂක පිරිසක්*** ඉදිරියේ ***සජීවීව*** කරනු ලබන ***ශ්‍රව්‍ය දෘශ්‍ය*** වූ ***අනුකරණ*** ක්‍රියාවයකි.

***කතන්දරයක්*** යනු .....

***කියවා*** හෝ ***අසා රසවිඳීමට*** හැකි,***දීර්ඝ කතා පුවත්*** ඇතුළත්,***චරිත,ස්ථාන ,සිදුවීම් විශාල ප්‍රමාණයක්*** ඇතුළත්,***සිදුවීම් අනුපිලිවලින් ගලා නොගියද*** රසයට බාධාවක් නොවන ,***ඕනෑම මොහොතක රසවිඳිය හැකි,ශ්‍රව්‍ය*** කලාවකි.

ක්‍රියාකාරකම් 1 පහත දී ඇති තොරතුරු පාදක කොට ගනිමින් නාට්‍යක සහ කතන්දරයක ලක්ෂණ වෙන් වෙන් වශයෙන් වගුගත කරන්න.ඒ සඳහා ඉහත දී ඇති තොරතුරු ගොනුවද ඇසුරු කොට ගන්න.

- චරිත විශාල ප්‍රමාණයක් ඇතුළත් වේ.
- සාමුහික කලාවකි.
- ස්ථාන විශාල ප්‍රමාණයක් ඇතුලත්වේ.
- කතා විකාශනයේ කාර්යය දීර්ඝ කාලයක් විය හැක.
- තනිව ඉදිරිපත් කළ හැක.
- සුළු චරිත ප්‍රමාණයක් / අත්‍යවශ්‍යම චරිත පමණක් යොදා ගනී
- කතා වස්තුවේ විකාශනය කෙටි කාලීන විය යුතුය.
- තනිව රස විදීමට හැක.
- නරඹන්නා ප්‍රධාන වේ.
- බොහෝවිට එක් ස්ථානයක් පසුබිම් වේ.
- සංවාද භාවිතය ප්‍රබල වේ.

ක්‍රියාකාරකම 2.ඔබ නරබා ඇති වේදිකා නාට්‍යයක් සහ කියවා හෝ අසා ඇති කතන්දරයක් ඇසුරෙන් නාට්‍යයක හා කතන්දරයක සමානතා ලියන්න.